සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක **42/2026**

මගේ අංකය:-PPSC/ES/14/FI/2/27-4
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය,රත්නපුර
2026.10. 16

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව

2. පළාත් ආදායම් කොමසාරිස්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම (සීමිත බඳවා ගැනීම) සඳහා අයදුම්පත් කැඳවීම -2026

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.12.10 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි විධායක සේවා ගණය (SL 1-2025) හා ක්ෂේත්‍රගත/කාර්යාල ගත බණ්ඩ 02 සේවා ගණය (MN 5-2025) සඳහා වන සේවා ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/03/P2/01/Dept/01/01-02 හා 2026.09.23 දිනැති ලිපියේ නිර්දේශය පරිදි සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරේ පුරප්පාඩු 03ක් සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කර ලද සබරගමුව පළාත් ආදායම් සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ www.psc.sg.gov.lk සහ සබරගමුව පළාත් සභා වෙබ් අඩවියෙහි www.sg.gov.lk පළ කර ඇත. මෙම චක්‍රලේඛය ඔබ ආයතනය යටතේ සේවය කරන සුදුසුකම්ලත් නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.

02. මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය විධායක සේවා ගණය (SL 01 - 2025) - රු 82,150-10x2400-8x2940-17x3900-195,970/-

1.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම්

(i) සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

(ii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

2.0 සීමිත බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා ක්‍රමය

(i) සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරාගනු ලැබේ.

(ii) ජ්‍යෙෂ්ඨත්වය මත උපරිම ලකුණු 60ක් වෙන් කරනු ලැබේ. ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබා දීම සිදුවන්නේ ක්ෂේත්‍රගත, කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියට පත්ව වසර 05 ඉක්මවීමෙන් පසුවය.

(iii) කුසලතාවය මත (සම්මුඛ පරීක්ෂණය මගින්) උපරිම ලකුණු 40ක් වෙන් කරනු ලැබේ.

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර			තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
1.ජ්‍යෙෂ්ඨත්වය මූලික සුදුසුකම සපුරා වසර 05 කට වැඩි වන • සම්පූර්ණ වසරකට ලකුණු 06 බැගින් • මාස 06 කට වැඩි වසරකට අඩු කාලයක් සඳහා ලකුණු 03 බැගින් • මාස 03 කට වැඩි මාස 06 කට අඩු කාලයක් සඳහා ලකුණු 02 බැගින්		60	40%
2.කුසලතාවය (සම්මුඛ පරීක්ෂණය මගින්)			
2.1 ප්‍රඥප්ති පිළිබඳ අවබෝධය (සටහන 1)	10	40	
2.2 අමතර අධ්‍යාපන සුදුසුකම් (සටහන 2)	05		
2.3 අමතර වෘත්තීය සුදුසුකම් (සටහන 3)	07		
2.4 භාෂා පිළිබඳ කුසලතාවය (සටහන 4)	03		
2.5 විෂයය බාහිර ක්‍රියාකාරකම් (සටහන 5)	05		
2.6 ප්‍රශංසා සහ ඇගයීම්	05		
2.7 සම්මුඛ සාකච්ඡාවේ දී දක්වන කුසලතාවය	05		
මුළු ලකුණු		100	

සටහන්

1. **<u>ප්‍රඥප්තිය පිළිබඳ ව අවබෝධය</u>**
   අහඹු ලෙස ලබා දෙන අංකයට අදාළව සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රඥප්ති වලට අදාළ වගන්ති අර්ථ දැක්වීම සහ පැහැදිලි කිරීම.

2. **<u>අමතර අධ්‍යාපන සුදුසුකම් උපාධි/ඩිප්ලෝමා</u>**
   බදවා ගැනීමේ සුදුසුකම හැර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපලේඛන 01 හි (සබරගමුව පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාවේ) සඳහන් විෂයය ක්ෂේත්‍රයන් වෙනුවෙන් ලබාගත් සහතික

   පශ්චාත් උපාධිය - ලකුණු 04
   පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 03
   උපාධි /වෘත්තීමය කුසලතා - ලකුණු 02
   ඩිප්ලෝමා - ලකුණු 01

3. **<u>අමතර වෘත්තීය සුදුසුකම්. පුහුණු/ව්‍යාපෘති</u>**
   පළාත් ආදායම් සේවයේ සියලුම නිලධාරින්ට පොදු, දින 02 හෝ ඊට වැඩි පුහුණු පාඨමාලා /වැඩමුළු සඳහා සහභාගිවීම .

   දේශීය - (එක් පාඨමාලාවකට 01 ලකුණ බැගින් උපරිම 05 ක් සඳහා) ලකුණු 05
   විදේශීය - (එක් පාඨමාලාවකට 01 ලකුණ බැගින් උපරිම 02 ක් සඳහා) ලකුණු 02

4. <u>භාෂා පිළිබඳ කුසලතාවය</u>

අයදුම්කරු විසින් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු සුදුසුකමක් නොවනවිට සහ සේවයට බැඳි භාෂාව නොවන විට අනෙක් රාජ්‍ය භාෂාව වෙනුවෙන් සහ ඉංග්‍රීසි භාෂාව වෙනුවෙන්

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඩිප්ලෝමා සහතිකය	- ලකුණු 02
රාජ්‍ය භාෂා පළමු මට්ටම	- ලකුණු 02
රාජ්‍ය භාෂා අනෙකුත් මට්ටම් සඳහා	- ලකුණු 01

අ.පොස සා/පෙළ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි /දෙමළ පාඨමාලා සහතික සඳහා එක් සහතිකයකට එක් ලකුණ බැගින් හිමි වේ.

එහෙත්, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අනිවාර්ය නිලධාරීන් එම ප්‍රවීණතාවය වෙනුවෙන් සුදුසුකම් කිහිපයක් ලබා ගෙන ඇති විට එම අනිවාර්ය සුදුසුකම හැර අනෙකුත් සුදුසුකම් සඳහා ඉහත පරිදි ම ලකුණු ලබා දෙනු ලැබේ.

5. <u>විෂයය බාහිර ක්‍රියාකාරකම්</u>

දෙපාර්තමේන්තුවේ පොදු කටයුතුවල දී දක්වන ක්‍රියාශීලිත්වය, ආකල්ප, අනලස් බව, විෂයය බාහිර කටයුතුවලට දක්වන සහභාගිත්වය සම්බන්ධයෙන් ලිඛිත තහවුරුවක්.

සටහන :- ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සඳහා අපේක්ෂකයින් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාව සඳහා උසස්වීම් කරනු ලැබේ.

3. **අයදුම්කළ යුතු ආකාරය**

මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් පළාත් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් ආදායම් කොමසාරිස් විසින් තමන්ට ඉදිරිපත් වූ අයදුම්පත් වහාම එකම ආවරණ ලිපියකින් ප්‍රධාන ලේකම් මගින් මෙම කොමිෂන් සභාව වෙත **2026.11.15** (මෙම දිනයට ජ්‍යෙෂ්ඨතාවය ඇතුළු අනෙකුත් සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.) දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු සමග පරීක්ෂා කර බලා අයදුම්පත්‍රයේ සඳහන් කරුණු සහතික කරමින් අයදුම්පත් නිර්දේශ කර මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

ආදර්ශ අයදුම් පත්‍රය

සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම (සීමිත බඳවා ගැනීම) සඳහා අයදුම්පත් කැඳවීම -2026

1.0 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම -.....
.....

1.2 මුලකුරු සමඟ නම -.....

1.3 ජාතික හැඳුනුම්පත් අංකය -.....

2.0 2.1 දැනට සේවය කරන ස්ථානය හා එහි ලිපිනය -.....
.....
.....

2.2 දුරකථන අංකය - පෞද්ගලික.....
කාර්යාලීය.....

3.0 සබරගමුව පළාත් ආදායම් සේවයේ දැනට දරණ තනතුර හා ශ්‍රේණිය .....

4.0 ඉහත තනතුරට හා ශ්‍රේණියට පත් වූ දිනය.....

5.0 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වූ දිනය.....

6.0 **2026.11.15** දිනට සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ සේවා කාලය
අවුරුදු ..... මාස..... දින.....

7.0 **2026.11.15** දිනට සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ වසර 05කට පසු සේවා කාලය
අවුරුදු ..... මාස..... දින.....

8.0 අඩවැටුප් /වැටුප් රහිත නිවාඩු ලබා ඇත /නැත.....

9.0 ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.....
දිනය

.....
අයදුම්කරුගේ අත්සන

10.0 **දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ .....මහතා/මෙනවිය/මහත්මිය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් ඒ අනුව සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ විධායක සේවා ගණය තක්සේරුකරු තනතුරට සීමිත බඳවාගැනීමට අයදුම්කිරීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති /නැති බවත් නිර්දේශ කරමි/නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු සඳහන් කරන්න)
.....
.....

.....
දිනය :..... දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

11.0 **ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

ඉහත නම් සඳහන් අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත තොරතුරු නිවැරදිය. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවාකාලය සම්පූර්ණ කර ඇත/නැත. පූර්වාසන්න වසර 5ක් තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇති /නැති බවත් පූර්වාසන්න වසර 05 තුළ දී ඔහු /ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත /නැත. ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් ආරම්භකර ඇත/නැත. විනයානුකූල කටයුත්තක් ආරම්භ කිරීමට අදහස් කර ඇත /නැත. **විධායක සේවා ගණය III ශ්‍රේණිය තක්සේරුකරු** තනතුර සඳහා **සීමිත බඳවාගැනීමට** අයදුම්කිරීම සඳහා ඔහු/ඇය සියලු සුදුසුකම් සපුරා ඇති /නැති බවත් නිර්දේශ කරමි /නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු සඳහන් කරන්න)

.....

.....

.....

.....
දිනය

.....
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත් සභාව
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)